# භික්ෂූන් වහන්සේ විඝද්ඝදූන් නො වීම

කාලාම සූත්‍රය ගැන අද බොහෝ දෙනා කතාකරන්නේ එය හේතුවාදයකට හෝ ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයකට හෝ සංසන්දනය කරමිනි. කාලාම සූත්‍රයෙහි අග දක්වා කියවන්නෝ විරල වෙති. විද්වතුන් යැයි කියන්නෝ ඒ සූත්‍රයෙහි ඇති ඇසූ පමණින් පොතක පතක තිබූ පමණින් පරම්පරාවෙන් ලැබුණු පමණින් ආදී වශයෙන් ඇති කොටස් ගැන පමණක් අවධානය යොමු කරති. කාලාම සූත්‍රයෙහි අවසානයෙහි දී කියැවෙන්නේ කාලාමයන් විඝද්ඝදූන් ආදර්ශයට ගත යුතු බව ය. සමාජයකට මග පෙන්වන්නේ ඒ සමාජයෙහි සිටින විඝද්ඝදූන් බව ඉන් කියැවෙයි.

මිහිඳු හිමියන් මෙරටට වැඩම කිරීමෙන් පසුව අප රටෙහි විඝද්ඝදූන් වූයේ භික්ෂූන් වහන්සේ බවට විවාදයක් නැත. ගිහියන්ට උන්වහන්සේ මුළුමනින් ම ආදර්ශයට ගතහැකි නොවුවත් උන්වහන්සේගේ මග පෙන්වීම අභියෝගයට ලක් නො වී ය. භික්ෂු ශාසනය පිරිහීමට පත්වූ අවස්ථා ගැන ඉතිහාසයේ සඳහන් වෙතත් නොබෝ කලකින් ම කතිකාවත් ශාසන සංශෝධන ආදිය ඔස්සේ සසුන නැවතත් යථා තත්වයට පැමිණවීමට හැකි විය. ට්‍රෙවෝ ලිං මහතා පෙන්වා දී ඇති ආකාරයට භික්ෂූන් වහන්සේ, රජු, ජනතාව යන ත්‍රිකෝණය මත සිංහල බෞද්ධ රාජ්‍යය ද, අනෙක් ථෙරවාදී රාජ්‍යයද සකස්විණි.

භික්ෂූන් වහන්සේට එදා රජු ද ජනතාව ද ගෞරව කෙළේ හුදෙක් ආගමික නායකයන් පමණක් ලෙස සලකා නො වේ. උන්වහන්සේ රජු ගේ ද ජනතාවගේ ද අනුශාසකයෝ ද ගුරුවරු ද වූහ. ඉන් අදහස් කරන්නේ එදා ගිහි ගුරුවරුන් නොසිටි බව නො වේ. එහෙත් ගුරුවරුන් අනුශාසකයන් ලෙස පිළිගැනීමේ දී භික්ෂූන් වහන්සේ ම ප්‍රධාන වූහ. වැවේ වතුර බෙදාගැනීමේ දී ද ඒ ඒ කන්නයේ වපුරන වී වර්ගය තීරණය කිරීමේදී ද භික්ෂූන් වහන්සේගේ උපදේශ අවශ්‍ය විය.

එවැනි සමාජයක ධර්ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ ගුරුවරු වීම පුදුමයක් නො වේ. එදා ප්‍රබුද්ධ භික්ෂූන් වහන්සේට අනෙක් භික්ෂූන් වහන්සේට හා ගිහියන්ට කියවිය යුත්තේ කිනම් පොත් ද යන්න නිර්දේශ කළහැකි විය. ථෙරවාදය ආරක්ෂාකිරීමේ කටයුත්තට ඇප කැප වී සිටි භික්ෂූන් වහන්සේ ජනතාව මනභාරතය හා රාමායනය පමණක් නොව මහායාන පොතපත කියවීමෙන් ද ඈත්කර තැබීමට කටයුතු කළහ යැයි සිතිය හැකි ය. ජනතාව භික්ෂූන් වහන්සේට සවන්දුන් බැවින් උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ පොතපත සිංහල බෞද්ධයන් අතර ජනප්‍රිය නො වී ය.

එහි වරදක් ඇතැයි යමකුට කිව හැකි ය. අනෙක් පොතපත කියවීමට ද අනුබල දීම ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයකට හා මානව අයිතිවාසිකම්වලට එකඟ යැයි පඬියකුට කීමට හැකි ය. එහෙත් අනෙක් සමාජවල ද තත්වය එසේ ම ය. පාසල්වල හා විශ්වවිද්‍යාලවල නිර්දේශ කෙරෙන්නේ ඒ ඒ සමාජයෙහි විඝද්ඝදූන්ට අවශ්‍ය පොතපත ය. අනෙක් පොත් නිර්දේශ කෙරුණ ද එහි විවේචන ද ඒ සමග ඉදිරිපත් වෙයි. ඒ හැරෙන්නට සමස්තයක් ලෙස ගත්කල ජනමාධ්‍ය ඔස්සේ ඉදිරිපත්වන්නේ ද ඒ ඒ සමාජයෙහි පැවැත්මට අවශ්‍ය දැනුම ය.

යම් සමාජයකට අභියෝග කරන දැනුමක් වේ නම් ඒ මුල දී ඉදිරිපත් කෙරෙන්නේ සම්මතයට පිටින් ය. ඇතැම්විට ඒ දැනුම කල්ගත වී සමාජට පිළිගෙන වෙනත් ම සමාජයක් ඇතිවීමට හැකි ය. එසේත් නැත්නම් ඒ නව දැනුමේ ඇතැම් කොටස් පවත්නා සමාජය විසින් උකහාගෙන ඒ සමාජයෙහි ම යම් යම් සංශෝධන ඇති කෙරෙනු ඇත. මෙරට පැරණි භික්ෂූන් වහන්සේ ඇතැම් මහායාන හා වෛදික දැනුම් සම්බන්ධයෙන් එසේ කර ඇත. උදාහරණයක් ලෙස මහායාන බෝධිසත්ව සංකල්පය ථෙරවාදයට අවශෝෂණය කෙරී ඇත්තේ ඉතා සියුම් හා දක්ෂ ආකාරයකින් ය.

එදා සමාජයෙහි භික්ෂූන් වහන්සේට තම ප්‍රධාන කාර්යය වූ ථෙරවාද බුද්ධාගම ආරක්ෂාකිරීමේ කටයුත්ත සාර්ථක ව කරගෙන යැමට හැකි වී තිබෙන බව පෙනී යයි. ථෙරවාදයට අභියෝග පැන නැගී විට විවිධ ක්‍රම මගින් ඒ පරාජය කරන්නේ කෙසේ දැයි උන්වහන්සේ දැන සිටියහ. මහාවිහාරයට (අනුරාධපුර යුගයෙන් පසුව මහාවිහාර සම්ප්‍රදායට)

© Prof. Nalin De Silva

එල්ල වූ අභියෝගවලින් අවුරුදු දෙදහසක් පමණ කල් ආරක්ෂා වී සිටීමට හැකිවීම ද ඉතා ඉහළින් ඇගයිය යුතු කරුණකි.

එහෙත් අද තත්වය එසේ නො වේ. භික්ෂූන් වහන්සේට මෙරට හිමි වූ තැන ඉතා හොඳින් අවබෝධකර ගැනීමට බ්‍රිතාන්‍යයෝ සමත්වූහ. ඔවුන් විසින් කහකඩය ලෙස හඳුන්වනු ලැබූ විවරය ඇතිතාක් හමුදා ක්‍රියාමාර්ගවලින් කෙසේ වෙතත් සංස්කෘතිකව (ආධ්‍යාත්මික ව) මේ රට යටත්කරගැනීමට නොහැකි බව ඔවුහු වටහාගත්හ. භික්ෂූන් වහන්සේට මෙරට තිබූ සුවිශේෂ තත්වය නැතිකිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය. මෙරට නව අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වාදීමට බ්‍රිතාන්‍යයන් කටයුතු කෙළේ එය ද මුල්කරගෙන ය.

1829 - 30 ඊනියා කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අරමුණක් වූයේ ක්‍රිස්තියානි අධ්‍යාපනයක් නිල වශයෙන් හඳුන්වාදීම ය. ලන්දේසීන් ද එවැනි අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දුන් නමුත් ඒ සාර්ථක නො වී ය. බ්‍රිතාන්‍යයන් එයින් ද පාඩම් ඉගෙන ගත්තාට සැකයක් නැත. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ කියා කීව ද එහි පරමාර්ථය වූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මෙරටට හඳුන්වාදීමත් මෙරට තිබූ ආර්ථිකය, පරිපාලනය, ජීවන රටාව ආදිය මුළුමනින් ම නැතිකර දැමීමත් ය. අප ඒවාට ප්‍රතිසංස්කරණ යැයි කියන්නේ එසේ කීමට බ්‍රිතාන්‍යයන් අපට පුරුදුකර ඇති බැවිනි.

කෝල්බෲක් කැමරන් යෝජනා ඔස්සේ අප රටෙහි බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රචලිත කිරීම ඇරඹිනි. ඒ යෝජනා 1815 දී අත්සන්කරන ලද සිංහල බ්‍රිතාන්‍ය ගිවිසුම හෙවත් උඩරට ගිවිසුම යැයි හැඳින්වෙන ගිවිසුමට පටහැණි විය. ගිවිසුම කැඩීම බ්‍රිතාන්‍යයන්ගේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයට, මානව අයිතිවාසිකම් රැකීම්වලට හා පොදුවේ මහත්මා ගතිගුණවලට එකගවූවා නිසැක ය. එහෙත් සිංහලයෝ නැති වී ගිය තම අයිතීන් වෙනුවෙන් නැගී සිටියහ. සුළු සුළු නැගිටීම් රාශියකින් පසුව සිංහලයෝ තව තවත් එකතුවූහ. 1840 දී පමණ බ්‍රිතාන්‍ය ආණ්ඩුව දළදා වහන්සේ රැකීමේ වගකීමෙන් මිදුණේ ය. මේ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස 1848 දී සිංහලයෝ විශාල සටනක් දියත් කළහ. භික්ෂූන්වහන්සේ ඒ සඳහා අවශ්‍ය උපදෙස් දුන්හ.

එහෙත් මේ වන විට සිංහලයන්ට සාම්ප්‍රදායික නායකයෝ නො සිටියහ. 1817 - 18 නිදහස් සටනින් පසුව බ්‍රිතාන්‍යයෝ එක්කෝ සිංහල නායකයන් ඝාතනය කළහ. නැත්නම් වරප්‍රසාද හා තනතුරු ලබා දී තම පැත්තට නම්මා ගත්හ. මේ වන විට බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාතී පිරිසක් ඇතිකර ගැනීම සඳහා පාසල් කිහිපයක් ද පිහිටුවා තිබුණි. ලංකාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවා එහි ප්‍රධානියා (ප්‍රධාන පරීක්ෂකවරයා - chief inspector) ලෙස ලංකාවේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි පල්ලියේ එවකට සිටි ප්‍රධාන පූජකවරයා පත්කෙරිණි. 1815 දී සිංහල රාජ්‍ය වංශය අවසන්වන තුරු අධ්‍යාපනයේ භික්ෂූන් වහන්සේ දැරූ තත්වය ක්‍රමයෙන් උන්වහන්සේට නැතිවීම ආරම්භ විය.

සිංහලයන්ගේ ගුරුවරුන් ලෙස භික්ෂූන් වහන්සේට තිබූ තත්වය පාසල් හා තෘතීයික අධ්‍යාපන ආයතන ඔස්සේ භික්ෂූන් වහන්සේට නැති වී ගොස් ය. දහනව වැනි සියවසේ අගභාගයේ දී පිරිවෙන් අධ්‍යාපනයෙහි පුනරුදයක් ඇති වූ නමුත් ඒ පිරිවෙන්වලට එවකට තහවුරු වී තිබූ උසස් පාසල්වලට හෝ තෘතීයික අධ්‍යාපනය දෙනු ලැබූ ආයතනවලට හෝ අභියෝග පිරීමට නො හැකි විය. බ්‍රිතාන්‍යයන් මෙරට ඉංගිරිසි අධ්‍යාපනය රැකියාව සමග මුල සිට ම බැඳ තිබූ හෙයින් රැකියාවක් ලබාගැනීමට නම්, විශේෂයෙන් ම ඉහළ රැකියාවක් ලබාගැනීමට නම් යා යුතු පාසල් කිහිපයක් විය. ඒ පාසල්වල අධ්‍යාපන මාධ්‍යය ඉංගිරිසි විය.

පාසල් වර්ග කෙරුණු ආකාරය අනුව රැකියාව ද තීරණය විය. උසස් යැයි සම්මත පාසල්, එතරම් උසස් නැති එහෙත් ඉංගිරිසි මාධ්‍යයෙන් අධ්‍යාපනය දෙනු ලැබූ පාසල් හා සිංහලෙන් හා දෙමළෙ මාධ්‍යවලින් අධ්‍යාපනය දෙනු ලැබූ පාසල් ලෙස දළ වශයෙන් පාසල් වර්ග කෙරිණි. ඒ ඒ පාසලේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන්ගේ රැකියා මේ පාසල් ධුරාවලිය අනුව සමස්තයක් ලෙස ගතහොත් තීරණය විය. අද ජාතික පාසල්, ජනප්‍රිය පාසල් ආදී වශයෙන් පාසල් වර්ගකෙරී ඇත්තේ ඒ පදනම ම සුළු වශයෙන් වෙනස් කෙරීමෙනි. ඒ ඒ පාසලට එලෙස පාසල් ධුරාවලියේ තැනක් හිමිවිණි.

© Prof. Nalin De Silva

අද ද දෙමව්පියන් තම දරුවන් ධුරාවලියේ ඉහළ පාසලකට යැවීමට උත්සාහ ගන්නේ මේ තත්වය හා ඔවුන් සිතන අයුරින් රැකියාවක් ලබාගැනීමට ඒ පාසල්වලට යැමෙන් ඇති ඉඩ කඩ ද සැලකීමෙනි. උසස් රැකියාවක් ලබාගැනීමේ දී විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ද  අවශ්‍ය වෙයි. ධුරාවලියේ ඉහළින් ම ඇති පාසල්වලින් විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට වැඩි ඉඩකඩක් ඇති බව ද දෙමව්පියෝ විශ්වාස කරති. අද අප මුහුණ පා ඇති ප්‍රධාන ප්‍රශ්න සියල්ලක් ම පාහේ බ්‍රිතානීන්ගේ පාලනයෙහි ප්‍රතිඵල වෙයි.

කෙසේවෙතත් භික්ෂුන් වහන්සේ මේ අධ්‍යාපන රටාවෙන් ඈත්කෙරිණි. පිරිවෙන් අධ්‍යාපනය රැකියාවක් ලබාගැනීම සඳහා උපකාරි නො විණි. එකල භික්ෂුන් වහන්සේ රැකියාවක් බලාපොරොත්තු නොවීම ද උන්වහන්සේ සම්මත අධ්‍යාපනයෙන් බැහැර කිරීමට හේතු විය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය දීමත් සමග තත්වය තවත් බැරෑරුම් විය. මෙරට විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය මුල දී ලංඩන් විශ්වවිද්‍යාලය මුල්කරගෙන සකස්විණි. එහි ප්‍රතිඵලය වූයේ එතෙක් පිරිවෙන් ඔස්සේ භික්ෂුන්වහන්සේ ප්‍රධාන තැන ලබාගත් සිංහල, පාලි, සංස්කෘත, බෞද්ධ ධර්මය වැනි විෂයවල ද ගිහියන් ක්‍රමයෙන් මූලිකත්වයට පැමිණීම ය.

භික්ෂුන් වහන්සේට අධ්‍යාපනයේ තිබූ තැන නැතිවීමත් සමග උන්වහන්සේ ආගමික හා සමාජයීය කටයුතුවලට පමණක් සීමාවූහ. අද ආගමික කටයුත්තකට හැර උපදෙසක් ලබාගැනීමට යමක් දැනගැනීමට පන්සලට යන්නෝ නො වෙති. ඇතැම් විට උසස් පෙළ විද්‍යා විෂය හදාරණ ශිෂ්‍යයා ද කල්පනා කරන්නේ තමන් භික්ෂුන් වහනාසේට වඩා දන්නා බව ය. මෙරට බ්‍රිතානීන් යටතේ සිදු වූ කරුණු දෙකක් නම් අධ්‍යාපනයෙහි භික්ෂුන් වහන්සේට තිබූ තැන නැතිවීමත්, සාමාන්‍යයෙන් භික්ෂුන් වහන්සේ ඉගෙන ගත් විෂයයනට  රටේ තැනක්, ඉල්ලමක් නැති වීමත් ය. භික්ෂුන් වහන්සේ සංකේත සංස්කෘතියෙහි කොටසක් බවට පත් කෙරිණි. උන්වහන්සේ අද මේ සමාජයෙහි විකද්කදුහු නො වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva